මාධ්‍ය ඔස්සේ සමාජයට පුවත් ඉදිරිපත් කරනා මාධ්‍යවේදියෙකු නැතිනම් මාධ්‍යයක් හැකිතාක් දුරට මධ්‍යස්ථ හා අපක්ෂපාතී විය යුතු බව නොකිවමනායි. යම් කිසි ප්‍රවෘත්තියකට සෘජුවම අදාළ නොවන්නේ නම්, පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ වර්ගය හෝ වාර්ගිකත්වය සඳහන් නොකරන ලෙසින් මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ දැක්වෙන්නේද ඊට අනුකූලව වේ. මන්දයත්, පුවතකට අදාළ නොවන අවස්ථාවක වර්ගයක් හෝ වාර්ගිකත්වයක් සඳහන් කිරීම ඔස්සේ, එම වර්ගය හෝ වාර්ගිකත්වය දරණ ජන කොට්ඨාසය සම්බන්ධයෙන් ඒකාකෘතික කිරීම් සහ ඒ අනුසාරයෙන් සමාජ කොන් කිරීම් හා ගර්හාවන් නිර්මාණය වීමට හැකි බැවිනි.

මේ අනුව, දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන් මගින් පුවතට සෘජුව අදාළ නොවන අවස්ථාවන්හිදී වර්ගය හෝ වාර්ගිකත්වයන් සඳහන් කිරීම සිදු නොකළ යුතු මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් ලෙසින් ඉදිරිපත් කර ඇත.

මෙම දත්ත සටහන ඔස්සේ අප ඉදිරිපත් කර ඇත්තේ 2019 වසර සහ 2020 වසර වලදී තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ උක්ත මාධ්‍ය ආචාර ධර්මය කඩ වී ඇති අවස්ථාවන් සංඛ්‍යාවයි. එහිදී සමස්තයක් ලෙසින් 2019 වසරට වඩා 2020 වසර තුළ පුවතට සෘජුව අදාළ නොවන අවස්ථාවන්හි වාර්ගිකත්වය සඳහන් කිරීමේ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය පහත ගොස් තිබෙනා බව නිරීක්ෂණය කළ හැක.

මූලාශ්‍ර:
https://www.editorscode.org.uk/the_code.php
http://www.slpi.lk/wp-content/uploads/2019/05/Editors-Code-Sin.pdf

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #SundayLankadeepa #Mawbima #SundayMawbima #Divaina #SundayDivaina #Dinamina #Silumina